# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.11.07<br>පැය 1345 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/2010 /2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |

**අන්තර්ජාලය හරහා සමාජ මාධ්‍ය ජාලා උපයෝගී කර ගනිමින් සිදු කරන මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් මහජනයා දැනුවත් කිරීම.**

අන්තර්ජාලය ඔස්සේ සිදුවන වංචනික ක්‍රියා, විශේෂයෙන් Telegram / WhatsApp ආදී ගිණුම් හරහා සහ වෙනත් සමාජ මාධ්‍ය සමූහ උපයෝගී කර ගනිමින් සිදුකරනු ලබන මූල්‍ය වංචා සම්බන්ධව පැමිණිලි දෛනිකව වාර්තා වේ.

මෙහිදී, පුද්ගලයින් වංචනිකව රවටා ඔවුන්ගේ ගිණුම් අංක, මුරපද, (User Name / Password) QR කේත ආදී රහස්‍ය තොරතුරු ලබා ගනිමින්, මාර්ගගත රැකියා අවස්ථා ලබා දෙන බවට පවසා, විවිධ ගිණුම් වලට මුදල් බැර කර ගැනීම් ආදි වංචා සිදු කරන බවට නිරීක්ෂණය වී ඇත.

විශේෂයෙන් මේ දිනවල යුරෝපීය රටවල රැකියා අවස්ථා සහ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවස්ථා සලසා දෙන බවට පවසමින් අන්තර්ජාලය ඔස්සේ පුද්ගලයන් රැවටීමට ලක්කර විශාල ලෙස මුදල් වංචා කිරීමේ සිදුවීම් වලට අදාල පැමිණිලි වාර්තා වීමේ ප්‍රවණතාවයක් නිරීක්ෂණය වී ඇති අතර උතුරු නැගෙනහිර පළාත්වල මෙම තත්ත්වය බහුලව දක්නට ඇත.

එබැවින් අන්තර්ජාලය භාවිතා කිරීමේදී මෙවැනි වංචා සම්බන්ධයෙන් අවබෝධයෙන් ක්‍රියා කරන ලෙසටත්, රැකියා අවස්ථාවලට සහ උසස් අධ්‍යාපන කටයුතු වලට යොමු වීමේදී රජයේ අනුමැතිය ලත් ආයතන වලින් සහ විදේශ සේවා නියුක්ති කාර්යංශය වැනි රජයේ ලියාපදිංචි ආයතන තුලින් පමණක් මෙවැනි අවස්ථා ලබා ගැනීමට මහජනතාව කටයුතු කල යුතු බවටත් දැනුම් දෙන අතර අන්තර්ජාලය භාවිතා කිරීමේදී පහත කරුණු සම්බන්ධයෙන් දැනුවත්ව ක්‍රියා කරන ලෙසට පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටී.

- භාවිතා කරනු ලබන සමාජ මාධ්‍ය ජාලා (Telegram / WhatsApp හෝ වෙනත්) ගිණුම් තුල නොදන්නා පුද්ගලයින් හා නොදන්නා සමාජ මාධ්‍ය සමූහ මඟින් විවිධ ආදායම් මාර්ග ලබා දෙන බව සඳහන් කරමින් සිදු කරනු ලබන වංචනික පෙළඹවීම් වලට හා ක්‍රියාවන්ට හසු නොවීම.
- නොදන්නා පුද්ගලයින් හා සමාජ මාධ්‍ය ජාලා සමූහ මඟින් පල කරනු ලබන අන්තර්ජාල දිගු හා ස්කෑන් කේත භාවිතයෙන් වැලකීම.
- සයිබර් අවකාශය තුල නොදන්නා පුද්ගලයින්ගේ ගිණුම් වෙත මුදල් බැර කිරීම, ඔවුන් සමඟ බැංකු තොරතුරු හුවමාරු කර ගැනීම, සිය බැංකු ගිණුම් වෙනත් පුද්ගලයින් වෙත භාවිතය සඳහා අවසර ලබා දීමෙන් වැළකීම.
- ගිණුම් අංක, මුරපද OTP කේත බාහිර පුද්ගලයින් සමඟ කිසිම අවස්ථාවකදී හුවමාරු කර නොගැනීම.
- නොදන්නා පුද්ගලයින් ලබා දෙන ජංගම යෙදවුම් ස්ථාපනය කිරීමේදී හා අන්තර්ජාල දිගු භාවිතා කිරීමේදී ආරක්ෂිත උපක්‍රම පිළිබඳ සැලකිලිමත් වීම හා විද්‍යුත් උපකරණයේ පවතින ප්‍රවේශ අවසරය ලබා නොදීම.

මේ සම්බන්ධයෙන් ඔබ මාධ්‍ය ආයතන මඟින් මහජනතාව දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**